[සියලු ම හිමිකම් ඇවිරිණි // All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| ...11...ශ්‍රේණිය | විෂයය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

නම ..............................................................................................................................................

**සැලකිය යුතුයි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.**

1. දත්ත සහ තොරතුරු වඩාත් හොඳින් අර්ථ දක්වන්නේ පහත කවර ප්‍රකාශය මඟින් ද?
   (1) දත්ත සහ තොරතුරු දෙකම තීරණ ගැනීමට උදව් වේ.
   (2) දත්ත අර්ථාන්විත වන අතර තොරතුරු අර්ථාන්විත නොවේ.
   (3) දත්තයක් ලෙස ජාතික හැඳුනුම්පත ගත් විට එය විශ්ලේෂණයෙන් තොරතුරු ලබා ගත හැකිය.
   (4) දත්තයක් නොවන සෑම දෙයක්ම තොරතුරකි.

2. $6F_{16}$ තුල්‍ය වනුයේ පහත කුමන අගයටද?
   (1) $1110111_2$ (2) $167_8$ (3) $113_{10}$ (4) $157_8$

3. කුමාරගේ උපන්දිනය දා ඔහු තම පන්තියේ යහළු යෙහෙළියනට චොකලට් හෝ බිස්කට් සමඟ බීම වලින් සංග්‍රහ කරන ලදී. මෙහි සංග්‍රහයට අදාල දෑ තෝරා ගැනීමේ තර්කය කුමක්ද?
   (1) OR , AND (2) AND, OR (3) NOT, AND (4) NOT, OR

4. පහත සඳහන් දෑ අතුරෙන් අවම අගය ඇත්තේ කුමක්ද?
   (1) $1100101_2$ (2) $76_{10}$ (3) $113_8$ (4) $6B_{16}$

5. ගොනුවේ විශාලත්වය (File size) වැඩිම වන්නේ පහත සඳහන් කවරකද?
   (1)බයිට් 850 ක් වූ .txt ගොනුව (2) මෙගා බයිට් 2 ක් වූ .doc ගොනුව
   (3) කිලෝ බයිට් 700 ක් වූ ,gif ගොනුව (4) කිලෝ බයිට් 1024 ක් වූ , pptx ගොනුව

6. ASCII කේත ක්‍රමයේදී "E" අනු ලක්ෂණය $1000101_2$ ලෙස නිරූපනය කරයි නම් "G" අනුලක්ෂයේ ASCII අගය දශමය පාදයෙන් කීයද?
   (1) 67 (2) 70 (3) 69 (4) 71

7. දශමය සංඛ්‍යා ක්‍රමයේ එක් සංඛ්‍යාංකයක් නිරූපණය සඳහා ද්වීමය කේතික දශමය (BCD) බිටු (bits) හතරක් භාවිතා කරයි. පහත සඳහන් ඒවායින් BCD කේත ක්‍රමයෙහි වලංගු බිටු මෝස්තරයක් නොවන්නේ කුමක්ද?
   (1) 0010 (2) 1101 (3) 0101 (4) 0110

8. මධ්‍ය සැකසුම් ඒකකය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න. මින් කුමක් නිවැරදි වන්නේද?
   (a) මධ්‍ය සැකසුම් ඒකකය සමන්විත වන්නේ අංක ගණිතමය හා තාර්කික ඒකකය පාලන ඒකකය හා පඨන මාත්‍ර මතකයෙනි.
   (b) උපදෙස් ක්‍රියාත්මක කරන තුරු තාවකාලිකව දත්ත ගබඩා කර තබා ගනු ලබන්නේ පඨන මාත්‍ර මතකය තුළය.
   (c) ගණිතමය හා තාර්කික ඒකකය සියළු ගණිතමය හා තාර්කික කටයුතු සිදු කරනු ලබයි.
   (1) a පමණි (2) b පමණි (3) c පමණි (4) a හා c පමණි


9. දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශ යුගලයන් එකිනෙක ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| L දත්ත සම්ප්‍රේෂණ තත්වය වර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම | Q සමක්ෂක කේබලය |
| M නම්‍යශීලී වන අතර කට දළපරිම දුර 100ත්ත සම්ප්‍රේෂණය සඳහා සුදුසු බව | R වැසුණු ඇඹරූ කම්බි යුගල |
| N තඹ කම්බි දැලක් ආකාරයේ වූ පිටත කේබලය වටා විද්‍යුත් චුම්බකත්වයක් ඇති කරයි. | S නොවැසුණු ඇඹරූ කම්බි යුගල |

   (1) (L-P) (M-Q) (N-S) (2) (L-S) (M-R) (N-Q)
   (3) (L-Q) (M-S) (N-R) (4) (L-R) (M-S)(N-Q)

10. පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ශ්‍රී ලංකාවේ G2C සේවා හා බැඳී පවතීද ( රජයෙන් පුරවැසියන්ට)
    (a) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලබා දීම.
    (b) ව්‍යාපාර ලියාපදිංචිය
    (c) වාහන බලපත්‍ර අලුත් කර දීම
        (1) a පමණි.  (2) a හා b පමණි  (3) a හා c පමණි  (4) a, b, හා c පමණි
11. දැක්වීමේ උපක්‍රම (pointing devices) සඳහා උදාහරණයක් නොවන්නේ
        (1) Joy stick  (2) Touch screen  (3) Bar code reader  (4) Mouse
12. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
    (a) සසම්භාවී පිවිසුම් මතකය (RAM) නශ්‍ය මතකයකි.
    (b) Cache memory තුළ BIOS තැන්පත් කර ඇත.
    (c) ROM යනු ප්‍රාථමික මතකයකි.
    මින් නිවැරදි වන්නේ
        (1) a හා b පමණි  (2) b හා c පමණි  (3) a හා c පමණි  (4) a, b හා c සියල්ල
13. මුද්‍රණ යන්ත්‍රයක් පරිගණකයට සවි කිරීම සඳහා භාවිතා කළ හැකි කෙවෙනිය වන්නේ,
        (1) PS/2 කෙවෙනිය  (2) සමාන්තර කෙවෙනිය
        (3) ශ්‍රේණිගත කෙවෙනිය  (4) HDMI කෙවෙනිය
14. ජාලයේ ඇති සියලුම පරිගණක එකිනෙක හා සම්බන්ධ වන අයුරින් සකස් කරන පරිගණක ජාල ස්ථල විද්‍යාව වන්නේ,
        (1) Mesh topology  (2) Tree topology  (3) Star topology  (4) Bus topology


15.




පරිපථයට අදාල බූලීය ප්‍රකාශනය වන්නේ

(1) $(\overline{A} + B) . \overline{B}$  (2) $(\overline{A}+B).B$  (3) $(\overline{A}.B) + \overline{B}$  (4) $(\overline{A}+B) + B$

16. තත්‍ය කාල (Real time) මෙහෙයුම් පද්ධතියක් සඳහා උදාහරණයකි.
        (1) ATM යන්ත්‍රය  (2) Windows  (3) MS- Dos  (4) Windows server
17. වදන් සැකසුම් මෘදුකාංගයක ඇති සුවිශේෂී පහසුකම වන්නේ
        (1) පෙර දසුන බලා ගැනීම.  (2) වදන් සෙවුම හා ප්‍රතිස්ථාපනය
        (3) අක්ෂර වින්‍යාස දෝෂ සෙවීම හා නිවැරදි කිරීම.  (4) තැපැල් මුසුව
18. වචන ප්‍රතිස්ථාපනය සඳහා වදන් සෙවුම මෘදුකාංගයකදී භාවිතා වන කෙටි මං යතුර කුමක්ද?
        (1) Ctrl + A  (2) Ctrl + P  (3) Ctrl + H  (4) Ctrl + S
19.




ඉහත රූපයෙහි C1 කොටුවේ ඇති සූත්‍රය (formula) = $A$1 + B1 වන විට එය C2 කෝෂයට පිටපත් කරන ලද්දේ නම් ප්‍රතිදානය කුමක් වේද?

        (1) 10  (2) 23  (3) 14  (4) 18
20. =A1*B2 – (B1^2/B2) හි අගය කොපමණද?
        (1) 40  (2) 46  (3) 44  (4) 36
21. සංඛ්‍යා පරාසයක පිහිටි සංඛ්‍යා අතුරෙන් උපරිම අගය ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි ශ්‍රිතය කුමක්ද?
        (1) = max()  (2) =min()  (3) =count()  (4) =sum()

22. ඔබ ශ්‍රී ලංකාවේ වැසි වනාන්තර පිලිබඳව ඉදිරිපත් කිරීමක් (presentation) පිළියෙල කරන්නේ යැයි උපකල්පනය කරන්න. සමර්පන මෘදුකාංගයක් (presentation software) භාවිතා කර ඔබේ ඉදිරිපත් කිරීමෙහි ,

(a) ශ්‍රී ලංකා සිතියමක්

(b) භාවිතා කරන්නන් සම්බන්ධ කළ හැකි අන්තර්ජාල වෙබ් සබැඳියක් වෙත යොමු කරන අධි සන්ධානයක් (hyper link)

(c) වැසි වනාන්තර හා සම්බන්ධ ශ්‍රව්‍ය දෘශ්‍ය පසුරක් (video link)

යන ඒවා අතුරෙන් කවර ඒවා අඩංගු කළ හැකිද?

(1) a හා b පමණි (2) b හා c පමණි (3) a හා c පමණි (4) a , b ,c සියල්ලම

23. ඉ සමර්පණ මෘදුකාංගයක් නොවන්නේ

(1) Apple keynote (2) Libreoffice impress

(3) iWork pages (4) Coral presentation

24. පොතක මිල ත්පො ,කර්තෘගේ නම ,ගණන යන ක්ෂේත්‍ර වලට අදාල දත්ත ප්‍රරූප පිලිවෙලින් සඳහන් වන්නේ

(1) Numbers, currency, text (2) Text, currency, numbers

(3) Currency, numbers, text (4) Currency, text, numbers

25 සිට 29 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහතින් ලබා දී ඇති දත්ත සමුදා වගු පාදක කරගන්න.

පාඨමාලා වගුව (course )

| CourseID | CourseName | CourseFee (Rs) |
|---|---|---|
| C001 | Fundermental of ICT | 15000.00 |
| C002 | Computer hardware | 20000.00 |
| C003 | Network | 30000.00 |
| C004 | Internet and E-mail | 25000.00 |

ශිෂ්‍ය වගුව(Student)

| SID | SName | CourseID |
|---|---|---|
| S001 | Nuwani Tharuka | C002 |
| S002 | Ameesha induwari | C004 |
| S003 | Sithumini Sewwandi | C001 |
| S004 | Nimeshi Bagya | C003 |
| S005 | Fathima | C001 |

25) පාඨමාලා වගුවේ ඇති Field ගණන හා Record ගණන පිළිවෙලින් දැක්වෙන්නේ.

(1) 3, 4 (2) 4 , 3 (3) 5, 3 (4) 3, 5

26) CourseFee සඳහා සුදුසු දත්ත ප්‍රරූපය කුමක්ද?

(1) Number (2) text (3) Boolean (4) Currency

27) දත්ත සමුදායේ ප්‍රාථමික යතුරක් හා ආගන්තුක යතුරක් පිළිවෙලින් දැක්වෙන්නේ

(1) ශිෂ්‍ය වගුව ------→SID පාඨමාලා වගුව -→ CourseId

(2) ශිෂ්‍ය වගුව---→ SID ශිෂ්‍ය වගුව--→ CourseId

(3) පාඨමාලා වගුව-→ CourseId හිෂ්‍ය වගුව--→SName

(4) ශිෂ්‍ය වගුව-→ CourseId පාඨමාලා වගුව------CourseFee

28) Sithumini Sewwandi ශිෂ්‍යාව හදාරන පාඨමාලාව කුමක්ද?


(1) Fundermental of ICT (2) Computer Hardware

(3) Network (4) Internet and E-mail

29) Nimeshi Bagya ශිෂ්‍යාව හදාරන පාඨමාලාවේ CourseFee කීයද?

(1) 15000.00 (2) 20000.00 (3) 30000.00 (4) 25000.00

30) පහත ගැලීම් සටහනේ ප්‍රතිදානය වන්නේ




(1) 10 (2) 11 (3) 9 (4) 3

31) පහත ව්‍යාජ කේතයෙහි ප්‍රතිදානය කුමක්ද?

```
X=60
Y=4
    Repeat
        Y=Y-1
        X=X+Y
    Until (Y<2)
    Print X
```

(1) 66 (2) 50 (3) 63 (4) 65

32) පහත දැක්වෙන ක්‍රමලේඛ භාෂා සලකා බලන්න.

a) යන්ත්‍ර භාෂා b) එසෙම්බ්ලි භාෂා c) ඉහල මට්ටමේ භාෂා

ඉහත ක්‍රමලේඛ භාෂාවන්ගේ පරම්පරා පටිපාටිය ආරෝහණව පෙන්නුම් කරනු ලබන්නේ පහත සඳහන් කවරකින් ද?

(1)a, b, c (2) b, c, a (3) c, b, a (4) c, a, b

33) විසඳුම් පරීක්ෂා කිරීමේ ක්‍රමයක් නොවන්නේ

(1) ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (2) නියමුමය පරීක්ෂාව (3) ඒකක පරීක්ෂාව (4) සමස්ත පරීක්ෂාව

34) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ අදියර පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

a) පද්ධතිය පිහිටුවීම
b) අවශ්‍යතා හඳුනා ගැනීම
c) පද්ධතිය නඩත්තු කිරීම
d) විසඳුම කේතකරණය
e) විසඳුම පරීක්ෂා කිරීම හා දෝෂ ඉවත් කිරීම
f) විසඳුම සැලසුම් කිරීම

(1)Abcdef (2) bcdefa (3) bfdeac (4) bfdaec

35) පද්ධති සංවර්ධන ආකෘතියක් නොවන්නේ

(1)සර්පිල ආකෘතිය (2) දියඇලි ආකෘතිය (3) මූලාදර්ශ ආකෘතිය (4) පුනර්කරණ ආකෘතිය

36) පහත සඳහන් දෑ සලකන්න.

a) පරිගණකයෙහි දෘඩාංග පිරිවිතර
b) අලෙවිකරණ වෙළඳ ආයතනයෙහි කීර්ති නාමය
c) වගකීම් කාලය සහ අලෙවියෙන් පසු සේවාවේ ගුණාත්මක බව

පරිගණකයක් මිලදී ගන්නා විට ඉහත කුමන කාරණා වැදගත් වේද?

(1) a හා b පමණි (2) a හා c පමණි (3) b හා c පමණි (4) a , b, c සියල්ලම

37) ලෝක විසිරි වියමනෙහි (WWW) පවතින සෑම වෙබ් පිටුවක්ම අනන්‍ය වූ හඳුන්වනය වන්නේ,

(1) අධිසන්ධානයයි. (hyperlink)
(2) ඒකාකාර සම්පත් නිශ්චායකයයි. (URL)
(3) IP ලිපිනයයි.
(4) E- mail ලිපිනයයි.

38) අන්තර්ජාලය පිලිබඳ පහත ප්‍රකාශ සලකන්න.

a) වෙබ් පිටුවක බහු මාධ්‍ය අන්තර්ගත විය හැකිය.
b) අන්තර්ජාලය හා www යනු එකම දෙයකි.
c) DNS server මඟින් URL, IP ලිපින බවට පරිවර්තනය කරයි.

මින් නිවැරදි වන්නේ,

(1) a හා b පමණි (2) a හා c පමණි (3) b හා c පමණි (4) a , b, c සියල්ලම

39) විද්‍යුත් තැපැල් ගිණුමක් තුළ මකා දමන ලද ලිපි යම් කාලයක් රඳවා තබා ගන්නේ කුමන ස්ථානයකද?

(1)Send (2) Inbox (3) Junk (4) Trash

40) පහත ඒවායින් නිවැරදි සම්බන්ධය තෝරන්න.

(1) FTP----→ ගොනු හුවමාරුව
(2) ICMP --→ විද්‍යුත් තැපැල් හුවමාරුව
(3) HTTP ---→ දෝෂ ඇති අවස්ථාවල පණිවිඩ දැන්වීම
(4) SMTP --→ IP ලිපින හුවමාරුව

*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය -. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පත්‍රය II | පැය -2 යි. |
|---|---|---|---|

**සැලකිය යුතුයි. පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් ද ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න**

1) කෙටි පිළිතුරු ලියන්න.

i. මානව සම්පත කළමණාකරනයේ ප්‍රබල උපාංගයක් ලෙස ඇඟිලි සළකුණු යන්ත්‍රය වර්තමානයේ ප්‍රචලිතව පවතී. පහත රූප සටහන මගින් එම පද්ධතියේ ක්‍රියාකාරීත්වය නිරූපනය කරයි. ඇඟිලි සලකුණු යන්ත්‍රයට අදාල ආදාන සැකසීම ප්‍රතිදාන සඳහා උදාහරණ එක බැගින් ලියන්න.

| ආදාන | සැකසීම | ප්‍රතිදානය |
|---|---|---|

ii. ට්‍රාන්සිස්ටරය සොයා ගැනීමත් සමගම පරිගණකයේ සැකසුමෙහි විප්ලවීය වෙනසක් සිදුවිය. මෙම කියමන සනාථ කරණු පිණිස ට්‍රාන්සිස්ටරය මගින් අපට ලබා දුන් වාසි සහගත තත්ව 4ක් ලියන්න.

iii. ළමුන් හතර දෙනෙකු සඳහා කිලෝග්‍රෑම් වලින් ලබා ගත් බර පහත පරිදි විවිධ සංඛ්‍යා පාද වලින් ඉදිරිපත් කර ඇත.

ගයා - $45_{10}$ හරිත - $45_{8}$ මනෙතු - $28_{16}$ ඕෂේන් - $110000_{2}$

මෙම ළමුන් හතර දෙනා බර අනුව අඩු බරේ සිට වැඩි බර දක්වා පෙල ගස්වා ලියන්න.

iv. (a) 0.0101 යන ද්වීමය දශමය සංඛ්‍යාවට අදාල වැඩිම වෙසෙසි බිටුව(MSB) හා අඩුම වෙසෙසි බිටුව(LSB) නම් කරන්න.

(b) පූර්ණ සංඛ්‍යාවක් වන1000 ට අදාල වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය(MSD) හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය(LSD) නම් කරන්න.

v. පහත දැක්වෙන බූලියානු ප්‍රකාශනයට අදාල

$X = (\bar{A}.B) + (A + \overline{B})$

(a) තාර්කික පරිපථය ඇඳ දක්වන්න. (b) අදාල සත්‍යතා වගුව දක්වන්න

vi. පහත කාර්යයන් සඳහා භාවිතා කරන උපාංග මොනවාද? (කාර්ය අක්ෂරය සමඟ උපාංගය ලියන්න)


a. පරිගණක කිහිපයක් එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිතා කෙරේ.
b. පරිගණක ජාල කිහිපයක් එකිනෙකට සම්බන්ධ කිරීම.
c. පරිගණක ජාලයකට අනවසර පිවිසුම වැලැක්වීම සඳහා .
d. පරිගණක ජාලයක් මෙහෙයවන ප්‍රධාන පරිගණකය වන්නේ.

vii. පරිගණක කේත පිළිබඳ ඔබ ලබාඇති දැනුම භාවිතයෙන් පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

දශමය සංඛ්‍යා නිරූපනය සඳහා (a)..........................කේතක්‍රමය භාවිතා කරන අතර , එහි අනුලක්ෂණ ගණන (b) .........................කි . (c) ..........................කේතක්‍රමය සිංහල ජපන් චීන වැනි භාෂා නිරූපනය සඳහා භාවිතා වන අතර අනුලක්ෂණ ගණන(d).............................. කි.

viii. පහත දැක්වෙන විචල්‍යයන්ට අදාල දත්ත ප්‍රරූපය තෝරා ලියන්න.

| A - විචල්‍ය | B -දත්ත ප්‍රරූප |
|---|---|
| Avg | Integer |
| Count | Boolean |
| Pass | String |
| School | Real |




ix. ගැලීම් සටහන භාවිතයෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(a)මෙම ගැලීම් සටහනෙහි ප්‍රතිදානය ලියන්න


(b) මෙම ගැලීම් සටහනහි ඇතුලත් පාලන ව්‍යුහ ලියන්න.

x. ක්‍රමලේඛණ පැරඩයිම භාවිතයෙන් පහත වගුව පුරවන්න.

| විස්තරය | පැරඩයිම |
|---|---|
| 1. ඉතා හොඳින් ව්‍යුහගත වූ පියවර මාලාවකින් සමන්විත ක්‍රමලේඛණය | A.වස්තු නැඹුරු ක්‍රමලේඛණය |
| 2. ගැටළුව සහ අදාල විසඳුම ඉදිරිපත් කරන අතර විසඳන ආකාරය නොපෙන්වයි. | B.ව්‍යුහගත ක්‍රමලේඛණය |
| 3.පද්ධතිය සංරචකමය උපපද්ධති වලට බෙදා ඇති අතර ඉහල සිට පහලට ප්‍රවේශ ඇත. | C.ප්‍රකාශන ක්‍රමලේඛණය |
| 4.වස්තු යන සංකල්පය මත පදනම් වූ ක්‍රමලේඛණ | D පටිපාටිගත ක්‍රමලේඛණය |

**(ලකුණු 20)**

2 ) **(a)**




කාමරයක සවිකර ඇති වායු සමීකරණ යන්ත්‍රයක් ස්විච්යක්(Switch) මගින් ක්‍රියාත්මක කිරීමට හෝ උෂ්ණත්වය සහිත රාත්‍රී කාලයේදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි සවිකර ඇත. එහි පරිපථ සටහන ඉහත දක්වා ඇත.

I. එහි X හා Y ස්ථාන සඳහා ඔබ යෝජනා කරන තාර්කික ද්වාර මොනවාද? (ලකුණු 02)

II. එම තාර්කික පරිපථ සඳහා බූලිය ප්‍රකාශන ලියන්න. (ලකුණු 02)

(b) පහත දැක්වෙන කාර්යයන් කර ගැනීම සඳහා සුදුසු දෘඩාංග දී ඇති ලයිස්තුවෙන් තෝරා ලියන්න

a) පිටු ගණනකින් යුත් ලේඛනයක් කෙටි කාලයකින් පරිගණකට ඇතුළත් කිරීමට භාවිතා කරයි.

b) වෙළඳ ව්‍යාපාර හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල රිසිට්පත් මුද්‍රණයට භාවිතා කරයි.

c) පරිගණක ආශ්‍රිත සැලසුම් නිර්මාණ මුද්‍රණයට කිරීමට භාවිතා කරයි.

d) චෙක්පත්වල අංකය කියවා පරිගණකය වෙත ආදානය කරනු ලබයි

පද ලයිස්තුව - තාප මුද්‍රන යන්තුය , චුම්බක තින්ත අනුලක්ෂණ කියවනය(MICR) , ප්‍රකාශන අක්ෂර සංජානනය(OCR) , ලකුණුකරණය (Plotter) (ලකුණු 2)

(C) පහත දක්වා ඇති වගුවේ A සිට D දක්වා අක්ෂරවලින් විවිධ උපක්‍රම මගින් සිදු කරනු ලබන ක්‍රියාවලි දැක්වෙනඅතර එම උපක්‍රමය පරිගණකයට සම්බන්ධ කරන කෙවෙනි(Ports) ඉදිරියෙන් දැක්වේ. එම ක්‍රියාවලි සහ කෙවෙනි නියමිත අනුපිළිවෙලට සටහන් කර ලියන්න.

| | ක්‍රියාවලිය | | කෙවෙනිය |
|---|---|---|---|
| A. | බාහිර දෘඩ තැටියක් පරිගණකයට සම්බන්ධ කිරීම | P | HDMI |
| B. | බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සම්බන්ධ කිරීම | Q | RJ45 |
| C. | පැරණි මූසිකයක් පරිගණකයකට සම්බන්ධ කිරීම | R | USB |
| D. | පරිගණකයක් ස්විචයකට සම්බන්ධ කිරීම | S | PS/2 |

(ලකුණු 2)

(D) පහත දැක්වෙන එක් එක් මෙහෙයුම් පද්ධති සඳහා උදාහරණය බැගින් ලියන්න

a) ඒක පරිශිලක (single User)

b) බහු පරිශිලක (Multi User)

c) බහු කාර්ය(Multi-Tasking)

d) තත්‍යකාල(Teal time) (ලකුණු2)

03) . පෙරේරා මහතාගේ මාසික ආදායම් සහ වියදම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ. ඔහුගේ මාසික ආදායම ඇමරිකානු ඩොලර්වලින් ලැබෙන අතර ඔහු එය ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරගනී. ඇමරිකානු ඩොලරයේ වටිනාකම කොපමණද යන්න බැංකුවෙන් දැනගන්නා ඔහු එය E12 කොෂයේ සටහන් කරගනී.අවසානයේදී ඔහු වැඩපත සම්පූර්ණ කර මුද්‍රණය කරයි.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | මාසික අදායම් හා වියදම් | | |
| 2 | | | අදායම | US. ($) | රු.(RS.) | වියදම | රු.(RS.) |
| 3 | | | වැටුප් | $ 1,200.00 | Rs. 414,000.00 | ගෙවල් කුලී | Rs. 15,000.00 |
| 4 | | | වතුපිටි | $ 50.00 | Rs. 17,250.00 | ආහාරපාන | Rs. 20,000.00 |
| 5 | | | | | | වෛද්‍ය කටයුතු | Rs. 5,000.00 |
| 6 | | | | | | ප්‍රවාහන වියදම් | Rs. 4,500.00 |
| 7 | | | | | | | |
| 8 | | | එකතුව | | Rs.431,250.00 | මුළු වියදම | Rs. 44,500.00 |
| 9 | | | මුළු ආදායම | $ 1,250.00 | | | |
| 10 | | | ඉතිරිය | Rs.386,750.00 | | | |
| 11 | | | සමාජ සේවා කටයුතු සඳහා | | Rs.11,602.50 | | |
| 12 | | | විනිමය අනුපාතය 1$ | | **රු.345.00** | | |
| 13 | | | සමාජ සේවා කටයුතු වලට වෙන්කළ පසු ලැබෙන ඉතිරි මුදල | | **Rs.375,147.50** | | |

i. ඔහුගේ වැටුප ශ්‍රී ලංකා රුපියල් මගින් දැක්වීමට භාවිත කළයුතු සූත්‍රය කුමක්ද? (ලකුණු 1)

ii. එම සූත්‍රය වතුපිටිවලින් ලැබෙන ආදායම සෙවීමට පිටපත් කළේ නම් E4 කෝෂයේ දැක්වෙන සූත්‍රය කුමක්ද? (ලකුණු 1)

iii. ඔහුගේ වියදම් වල එකතුව සෙවීමට භාවිත කළ හැකි ශ්‍රිතය කුමක්ද? (ලකුණු 1)


iv. ඔහුට එම මාසය තුළ ලැබුන ඉතිරි මුදල සෙවීමට අදාළ සූත්‍රය ලියා දක්වන්න. (ලකුණු 1)

v. මොහු ඉතිරියෙන් 3% ක් සමාජසේවා කටයුතු සඳහා වෙන් කරයි නම් එම මුදල සෙවීමට E11 කෝෂයට අදාළ සූත්‍රය ලියන්න. (ලකුණු 2)

vi. සමාජ සේවා කටයුතු සඳහා මුදල් වෙන්කළ පසු ඉතිරි මුදල E13 කෝෂයට ඇතුළත් කිරීමට සිතන්නේ නම් එහි ලිවිය යුතු සමීකරණය ලියන්න. (ලකුණු 1)

vii. ගුණාත්මක ඉ සමර්පණයක ලක්ෂණ 2 ක් ලියන්න (ලකුණු 1)

viii. ඉ සමර්පණවලදී භාවිතා වන පහත දසුන් වර්ග වල නම්කරන්න. ඒ සඳහා වරහන් තුළ ඇති පද භාවිතා කරන්න.




(කදා සුබෙදුම් දසුන , සමර්පණ රාමු දසුන, සාමාන්‍ය දසුන, කියවීම් දසුන)

(ලකුණු 2)

4.) ඔබගේ නගරයේ ඇති ප්‍රසිද්ධ අවන්හලක් අහාර ඇනවුම් ලබා ගෙන නිවසට ලබා දීමට කටයුතු කරයි.එම ආයතනය පහත පරිදි දත්ත සමුදායක් පවත්වාගෙන යයි. පහත දැක්වෙන දත්ත සමුදා වගු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Food Item Table - ආහාර ද්‍රව්‍ය වගුව

| Item_ID | I_Name | Stock |
|---|---|---|
| 1001 | ඉදිආප්ප | 450 |
| 1002 | කොත්තු | 300 |
| 1003 | පැස්ටා | 250 |
| 1004 | පීට්සා | 350 |

Customer Table - පාරිභෝගික වගුව

| Cus_ID | Cus_Name | Address |
|---|---|---|
| 2110 | Sadun | Katutara |
| 2120 | Ruwan | Dodangoga |
| 2130 | Dasun | Yatadola |
| 2140 | Rangana | Matugama |

Purchase Table - මිලදී ගැනීම් වගුව

| Item_ID | Cus_ID | Count | Date |
|---|---|---|---|
| 1001 | 2110 | 5 | 2022/05/02 |
| 1002 | 2110 | 6 | 2022/05/03 |
| 1003 | 2120 | 4 | 2022/05/03 |
| 1004 | 2130 | 2 | 2022/05/05 |
| 1002 | 2140 | 10 | 2022/05/07 |

I. ඉහත එක් එක් වගුව සඳහා ප්‍රාථමික යතුරු 2 ක් වෙන වෙනම ලියන්න. (වගුවේ නම සමඟ) (ලකුණු 2)

II. මිලදීගැනීම් වගුවේ ක්ෂේත්‍රවලට අදාළ දත්ත ප්‍රරූප ලියන්න. (ලකුණු 2)

III. පහත දැක්වෙන වෙනස්කම් සිදුකිරීමට යාවත්කාලීන කළයුතු වගු /වගුවමොනවාද

a. රංගන කොත්තු 10 ක් නොව 8 ක් ලෙස දැක්වීමට

b. දසුන්ගේ පදිංචිය යටදොල නොව කඩවක ලෙස දැක්වීමට (ලකුණු 2)

IV. මෙම දත්ත සමුදායේ වගුවලට පහත සඳහන් පරිදි නව රෙකෝඩ ඇතුළත් කිරීමට අවශ්‍යවේ.එම රෙකෝඩ ඇතුළත් කළ පසු වගුවලට අදාළ රෙකෝඩ ක්ෂේත්‍ර සමඟ ලියන්න.

a. ෆ්‍රයිඩ්රයිස් 200 නව අයිතමයක් ලෙස ඇතුළත් කිරිම (ලකුණු 1)

b. නව පාරිභෝගිකයෙකු ලෙස නාගොඩ පදිංචි නුවන් ඇතුළත් කිරිම හා ඔහු විසින් 2022-05-08 දින කොත්තු 3 ක් මිලදී ගැනීම (ලකුණු 3)

05 **a)** සදුනි අ.පො.ස.(සා.පෙළ)විභාගයෙන් පසු පරිගණක පාඨමාලාවක් හැදෑරීමට තීරණය කළාය.ඇය එම ආයතනයට ගිය විට පහත විස්තර දැකගතහැකි විය.

- ඇයට තෝරා ගැනීමේ පරීක්ෂණයකට මුහුන දීමට සිදු වේ.
- තොරා ගැනීමෙ පරීක්ෂණයේ ලකුණු 75 ට වඩා වැඩි හෝ සමානනම් Higher Diploma Course සඳහා ද
- 39 ත් 75 ත් අතර නම් Diploma Course සඳහා ද
- ලකුණු 19 ත් 39 ත් අතර නම් Basic Course සඳහාද
- ලකුණු 19 හෝ ඊට අඩු නම් පාඨමාලාව සඳහා ලියාපදිංචි විය නොහැකි බව දැනුම්දෙන ලදි.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන තෝරා ගකහැකි පාඨමාලා ප්‍රතිදානය කිරීමට අදාල ගැලීම් සටහන අදින්න. (ලකුණු7)

b) පහත පැස්කල් කේත කොටස ක්‍රියාත්මකවූ පසු ලැබෙන ප්‍රතිදානය ලියන්න.

```
Var name: array [1..3] of string
Begin
Name[1] := amila;
Name[2]:= saman;
Name[3]:= suresh;
For i=1 to 3
Writeln(name[i]);
End.
```

(ලකුණු 3)

06). අමල් අත්යුරු තොරතුරු පවත්වාගෙන යන වෙළඳ සැලක හිමිකරුවෙකි. ඔහු තම ව්‍යාපාරය සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ පරිගණක පාදක තොරතුරු පද්ධතියක් හඳුන්වාදීමට තීරණය කරයි.

i. අත්යුරු තොරතුරු පද්ධතියට සාපේක්ෂව පරිගණක පාදක තොරතුරු පද්ධතියක් භාවිතයෙන් ඔහු ලබන වාසි 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. (a) නව පද්ධතියක් සඳහා අවශ්‍යතා හඳුනාගැනීමේ එක් ක්‍රම වේදයක් ලෙස **මූලාදර්ශ** හැඳින්විය හැකියි. මෙය හඳුන්වන්න. (ලකුණු 1)

(b) මීට අමතරව මේ සඳහා යොදා ගත හැකි ක්‍රමවේද 2ක් ලියන්න (ලකුණු 1)

iii. වෙළඳසල් හිමියාට මෙම පරිගණක පාදක තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීමේ දී යොදා ගත හැකි වඩාත් සුදුසු පද්ධති පිහිටු වීමේ ක්‍රමවේදය කුමක් දැයි ඔබ අපේක්ෂා කරන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 2)

iv. තොරතුරු පද්ධතිය අන්තර්ජාලයට සම්බන්ධ කිරීමෙන් ඔහුට ලබා ගත හැකි ප්‍රතිලාභ 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

v. වෙළඳ සලේ සේවකයෙක් හෝ සේවිකාවක් නව පද්ධතිය සමග පළමුව කටයුතු කරන්නේ පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන පියවරෙහි කුමන අවස්ථා වෙහිද? (ලකුණු 2)

7) පහත වගුවේ A තීරුවේ අවස්ථාන්ට ගැලපෙන B තීරුවේ උදාහරණ දැක්වෙන ලේබල ගලපා ලියන්න.

(අ)A තීරුවේ ඉලක්කමට ගැලපෙන B තීරුවේ අක්ෂරය තෝරා ලිවීම ප්‍රමාණවත් වේ

| A තීරුවේ | | B තීරුවේ | |
|---|---|---|---|
| 1 | IP ලිපිනය | A | tiwtter.com |
| 2 | වසම් නාම සේවා දායකය(DNS) | B | Google.com |
| 3 | අන්තර්ජාලයේ සේවාවකි. | C | Dotted Decimal Notation |
| 4 | වසම් නාමයකි | D | වසම් නාමය IP ලිපින බවට හරවයි |
| 5 | සමාජ ජාල | E | වළාකුළු පරිගණක |
| 6 | සෙවුම් යන්ත්‍රකි | F | Donenets.lk |

(ලකුණු 3)

(ආ)කමල් ,රවිදු වනිදු හා සනිදු වෙත ජනිත් විද්‍යුත් තැපැල් පණිවිඩයක් යවයි. එහි විද්‍යුත් තැපැල් ශීර්ෂ පහත දක්වා ඇත.ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| |
|---|
| TO : කමල් , වනිදු |
| Cc : රවිදු |
| Bcc : සනිදු |

- පහත A හා B ප්‍රකාශ සත්‍ය ද අසත්‍යද යන්න සඳහන් කරන්න.
  A. කමල්ට විද්‍යුත් ලිපියක් ලද බවට රවිදුට දර්ශනයවේ.
  B. සනිදුට විද්‍යුත් ලිපියක් ලද බවට වනිදුට දර්ශනයවේ.

i. සනිදුට දැක ගත හැකි අනෙක් විද්‍යුත් තැපැල් ලිපි ලාභින් කවුරුන්ද?

ii. විද්‍යුත් තැපැල් භාවිතයෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න (ලකුණු 3)

(ඉ)

i. HTML කේතයේ ප්‍රතිදානය ලියන්න.

<b><u><i> HYPPERTEXT MARKUP LANGUAGE<i><u><b> (ලකුණු 2)

ii. පහත දැක්වෙන ලයිස්තුවට අදාළ HTML කේතය ලියා දක්වන්න.

1. Sinhala
2. Tamil
3. Muslim
4. Burgher

(ලකුණු 2)

*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය -. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පිළිතුරු පත්‍රය 1/II |
|---|---|---|


1 පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 3 | 21 | 1 | 31 | 1 |
| 2 | 4 | 12 | 3 | 22 | 4 | 32 | 1 |
| 3 | 1 | 13 | 2 | 23 | 3 | 33 | 2 |
| 4 | 3 | 14 | 1 | 24 | 4 | 34 | 3 |
| 5 | 2 | 15 | 3 | 25 | 1 | 35 | 4 |
| 6 | 4 | 16 | 1 | 26 | 4 | 36 | 4 |
| 7 | 2 | 17 | 4 | 27 | 2 | 37 | 2 |
| 8 | 3 | 18 | 3 | 28 | 1 | 38 | 2 |
| 9 | 4 | 19 | 3 | 29 | 3 | 39 | 4 |
| 10 | 3 | 20 | 2 | 30 | 2 | 40 | 1 |

11 කොටස- පිළිතුරු

1. (i)ආදාන- ඇඟිලි සළකුණ - ලකුණු 0.5
   සැකසීම-සලකුණට අදාල පුද්ගල තොරතුරු පරීක්ෂාව - ලකුණු 1
   ප්‍රතිදානය- පැමිණි වේලාව/පිටවූ වේලාව - ලකුණු 0.5
   (ii)පරිගණකයේ වේගය වැඩිවීම /තාප ජනනය අඩුවීම/ විදුලි පරිභෝජනය අඩුවීම/ -
   විශාලත්වය අඩුවීම ලකුණු 0.5×4

   (iii) හරිත($37_{10}$), මනෙතු($40_{10}$), ගයා($45_{10}$) ,ඩිහේන්$(48)_{10}$. (ගණනය කර ඇති නම් පමනක් ලකුණු 2 ලබා දෙන්න.)
   (iv (a) )0.0101 - MSB= $1(2^{-2})$ LSB= $1(2^{-4})$ - ලකුණු 1
   (b) 1000 - MSD - 1 LSD - 0 - ලකුණු 1
   (v) (a) - - ලකුණු 1




(b

x=$(\overline{A}\,.\,B) + (A + \overline{B})$ - ලකුණු 1

| A | B | $\overline{A}$ | $\overline{B}$ | $(\overline{A}\,.\,B)$ | $(A+\overline{B})$ | X |
|---|---|---|---|---|---|---|
| 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 |
| 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 |
| 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 |
| 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 |

(vi) a) switch b) Router C) Firewall d) Server - ලකුණු 0.5×4

(vii) a)BCD b) 16 C) Unicode d)65536 - ලකුණු 0.5×4

(viii) Count-Integer Avg- real Pass-Boolean School- String - ලකුණු 0.5×4

(ix) a) X=3 - ලකුණු 1 b) selection/repetition/ sequence - ලකුණු 1

(x)

1 -පටිපාටිගත(D)


2 -ප්‍රකාශන(C)

3 -ව්‍යුහගත(B)

4 - වස්තුනැඹුරු (A) - ලකුණු 0.5×4

(2) a) i. X=NOT Y=AND - ලකුණු 2

ii. (A . B )+$\overline{C}$ - ලකුණු 2




b)

a) ප්‍රකාශන අක්ෂර සංජානනය(OCR)

b) තාප මුද්‍රන යන්ත්‍රය

ලකුණු 0.5×4 =2

c) ලකුණුකරණය (Plotter)

d) චුම්බක තින්ත අනුලක්ෂණ කියවනය(MICR)

(c) A – R , B – P, C – S , D - Q ලකුණු 0.5×4 =2

(d) **a)** – Dos , **b)** - Windows Server / Linux , **c)** Windows 7,8,10,11 /Ubuntu /Mac , **d)** ATM / calculator

ලකුණු 0.5×4 =2

3) i. =D3*E$12 ලකුණු 1

ii. =D4*E$12 ලකුණු 1

iii. =Sum(G3:G6) ලකුණු 1

iv. =E8-G8 ලකුණු 1

v. =D10*3% ලකුණු 2

Vi . =D10-E11 ලකුණු 1

vii සුදුසු පිලිතුර ඇත්නම් ලකුනු ලබා දෙන්න. ගුණාංග2 ක් අවශ්‍යවේ- ලකුණු 2

(අඩංගු විය යුතු වාක්‍ය හා පේළි ප්‍රමාණය.අකුරුවල විශාලත්වය , වර්ණ ගැන්වීම, අකුරු විලාසිතා භාවිතය

පින්තූර , චිත්‍රක , වගු , ප්‍රස්ථාර ඇතුළත් කිරීම .චලන චිත්‍ර සහ වීඩියෝ ඇතුලත් කිරීම)

Viii A) සාමාන්‍ය දසුන B) කදා සුබෙදුම් දසුන C) කියවීම් දසුන D) සමර්පන රාමු දසුන - ලකුණු 2

4) (I) Food Item Table - ආහාර ද්‍රව්‍ය වගුව - Item_ID

Customer Table - පාරිභෝගික වගුව - Cus_ID

Purchase Table - මිලදී ගැනීම් වගුව - Item_ID+ Cus_ID - ලකුණු 2

(ii) Item_ID – Text , Cus_ID - Text , Count – Number , Date – Date/time - ලකුණු 2

(iii) ( a)Purchase Table - මිලදී ගැනීම් වගුව (b) Customer Table - පාරිභෝගික වගුව - ලකුණු 2


(iv) (a) 1005 , ෆ්‍රයිඩ් රයිස් , 2000 ලකුණු 1

(b) Customer Table - පාරිභෝගික වගුව - 2150 , නුවන් , නාගොඩ

Food Item Table- ආහාර ද්‍රව්‍ය වගුව - 1002 , කොත්තු , 297

Purchase Table - මිලදී ගැනීම් වගුව - 1002 , 2150 , 3 , 2022/ 05/08 ලකුණු 3

5) a)




ලකුණු 7

(Start ,stop = 1

Input marks = 1

3 decision +yes ,no = 3

4 output = 2 )

5) b) ප්‍රතිදානය සිරස් ආකාරයට ලියා තිබිය යුතුයි ලකුණු 3

Amila (නම් 3 තිබිය යුතුයි)

Saman

Suresh

06)

(i) සුදුසු පිලිතුර ඇත්නම් ලකුනු ලබා දෙන්න. (දෝෂ සිදුවීම අවම වේ, අඩු කාලයකින් තොරතුරු සකසා ගත හැක, ඉතා සුළු ඉඩ ප්‍රමාණයක දත්ත ගබඩා කර තැබිය හැක.) ලකුණු 2

(ii) (a)පිහිටුවීමට බලාපොරොත්තුවන පද්ධතියෙහි අනුරුවක්(ආකෘතියක්)/Model ලකුණු 1

(b) නිරීක්ෂණය, සම්මුඛසාකච්චා , ප්‍රශ්නාවලි ලකුණු 1

(iii ) සමාන්තර පිහිටුවීම ලකුණු 2

පැරණි පද්ධතිය සම්පූර් ණ යෙන් ඉවත්කිරීම ආයතනයට අවදානම් බැවින් පැරණි පද්ධතිය සහ නව පද්ධති යන දෙකම ක්‍රියාත්මක කොට සාර්ථකත්වය අනුව නව පද්ධතිය ස්ථාපනය කිරීම වඩාත් යෝග්‍ය වේ.

(iv) 1. ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක දී පද්ධතියට ප්‍ර වේශ විය හැකි වීම
2.පහසුවෙන් යාවත්කාලීන කල හැකිවීම
3.විශ්ලේෂණයට පහසුවීම ලකුණු 2

(v) පද්ධති සංවර්ධන චක්‍ර යේ හතරවන පියවර -පද්ධති පරික්ෂාව
ප්‍රතිග්‍රහන පරීක්ෂාව ලකුණු 2

7) (අ)

| A තීරුවේ | | පිළිතුර | |
|---|---|---|---|
| 1 | IP ලිපිනය | C | Dotted Decimal Notation |
| 2 | වසම් නාම සේවා දායකය(DNS) | D | වසම් නාමය IP ලිපින බවට හරවයි |
| 3 | අන්තර්ජාලයේ සේවාවකි. | E | වළාකුළු පරිඝනක |
| 4 | වසම් නාමයකි | F | Donenets.lk |
| 5 | සමාජ ජාල | A | tiwtter.com |
| 6 | සෙවුම් යන්ත්‍රකි | B | Google.com |

ලකුණු 0.5×6 =3

(ආ) i) A සත්‍ය වේ B අ සත්‍ය වේ ලකුණු 1

ii) කමල් , චනිදු , රවිදු ලකුණු 1

iii) සුදුසු පිලිතුර ඇත්නම් ලකුනු ලබා දෙන්න ලකුණු 1.

(ඉ) (i) ***HYPPERTEXT MARKUP LANGUAGE*** ලකුණු 2

(ii)
```
<Html>
<Body>
<OL  type =  1 >
 <Li> Sinhala </Li>
<Li> Tamil </Li>
<Li> Muslim </Li>
<Li> Berger </Li>
</OL>
</Body>
</Html>
```
ලකුණු 2

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

Pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**